සන්නස SANNASA

# ලියා දක්වන වග

දේශගුණික හා ස්වභාවික සම්පත් අතින් ලෝකයේ ඉදිරියෙන්ම ඇති රටකි ශ්‍රී ලංකාව. එහෙත් ශ්‍රී ලංකා ජනතාව දරිද්‍රතාවයෙන් හා බිහිසුණු විදේශ ණය බරකින් මිරිකෙමින් සිටී.ණයට අදාළ පොලී මුදල ගෙවීමට පමණක් තවත් ණය ගැනීමට සිදුව ඇත. ලංකාවාසීන්ට ජීවත් වන්නට සිදුව ඇත්තේ රටේ සම්පත් විකුණමිනි.

ජේ ආර් ජයවර්ධන ජනාධිපතිවරයා රට භාර ගන්නා විට ලංකාවට කිසිදු විදේශ ණයක් ගෙවීමට තිබුනේ නැත.එහෙත් ඔහුගේ රජය ආරම්භයේ සිට සීමාවකින් තොරව ණයගැනීමත් ඒ ණය ගෙන ආරම්භ කල ව්‍යාපෘති එකක්වත් ආපසු ණය ගෙවීමට තරම් ඵලදායී නොවීමත්, ඔහුගේ අදුරදර්ශී ක්‍රියා පිළිවෙත් නිසා ඇති වූ එල් ටී ටී යුද්ධයත්, ජේ වී පී භීෂණයත් රටේ ධනය අති විශාල ලෙස කාබාසිනියා කරමින් රට අගාධයෙන් අගාධයට තල්ලුකර දැමිය. ඉන්පසු පත්වූ රජයන් ජේ වී පී භීෂණයත් එල් ටී ටී ඊ යුද්ධයත් අවසන් කල මුත් රට යලි ගොඩනැංවීමට ඔවුන්ට සාධාරණ කාලයක් ලැබුණේ නැත.

ඔස්ට්‍රේලියාවේ නිවැසි ශ්‍රී ලාංකීය ජනයාගේද සහයෙන් ශ්‍රී ලංකාවට නව ජනාධිපතිවරයෙක් නොබෝදා පත්කර ගන්න ලදී.දැන් සියළු දෙනාම නෙත් දල්වා බලා
සිටිනුයේ නව ජනපතිවරයා ශ්‍රී ලංකාව ඉහළට ඔසවා තබනු ඇතැයි කියාය.

ශ්‍රී ලංකාවේ නව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ නව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට මේ සඳහා ශක්තිය දෛයී ලැබේවායි ඔස්ට්‍රේලියානුවාසී ශ්‍රී ලාංකිකයින් ලෙස අපි ශුභාශිංසනය කරමු.

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්‍ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්
ප්‍රසාද් විජයබන්දු

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්‍ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Prasad : 0413 201 590**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# ආලින්දය



**අද ආලින්දයට ගොඩ වදින්නේ ලංකාවේ ප්‍රමුඛ සංගීත කණ්ඩායමක් වන මේරියන්ස් සංගීත කණ්ඩායමේ ප්‍රධානී නලින් පෙරේරා මහතා.**

**සන්නස.. සන්නස පුවත්පත වෙනුවෙන් අපි ඔබ ආයුබෝවන් කියා පිළිගන්නවා. මුලින්ම ඔබෙන් දැන ගැනීමට කැමතියි ඔබේ පාසල් ජීවිතය සම්බන්ධයෙන්**

නලින්.. මම ඉගෙන ගත්තෙ හලාවත ශාන්ත මරියා විද්‍යාලයේ. 1988 මා උසස් පෙළට තෝරා ගත්තේ ජීව විද්‍යා විෂයයන්. එවකට මා විද්‍යාලයේ ශිෂ්‍යනායකයෙක්.ටික කලක් ජීව විද්‍යා විෂයන් හදාරන කොට මට තේරුණා මෙය නොවෙයිමා යා යුතු මාර්ගය කියලා. ඉතින් මම වානිජ විෂය ධාරාවට මාරු වුනා. නමුත් එක් දිනක් ඇතුළතම මම තේරුම් ගත්තා මෙයත් මට ගැළපෙන දෙයක් නෙමෙයි කියලා. මගේ ගොඩක් හිතවත්ම මිත්‍රයෝ හිටියේ ගණිතය හදාරමින්. ඒ නිසා මම පාසලේ විදුහල්පතිතුමාගෙන් ඉල්ලලා ගණිත විෂය ධාරාව හදාරන්නට ඒ අංශයට මාරු වුණා.88 වර්ෂයෙහි අපේ විද්‍යාලයේ තිබුණා සංගීත තරගයක්. මම මේ සඳහා තමයි මගේ යාලුවොත් එකතුකරගෙන මුලින්ම සංගීත කණ්ඩායමක් පටන් ගත්තෙ. ඒ අවස්ථාවේ අපේ පාසලෙන් ඒකට විශේෂ තැනක් හම්බවුනා. මේ සංගීත කණ්ඩායමට නම තැබුවෙත් එවකට පාසලේ හිටපු විදුහල්පති ඇලෝසියස් සහෝදරතුමා. ඇත්තටම ඒ අපේ පාසලේ නමමයි. ඊට පස්සේ මම වෙනත් දෙයක් ගැන කල්පනා කළේ නෑ. කොහොම හරි මේ සංගීත කණ්ඩායම ඉදිරියට ගෙන යන්න ඕනි කියල තමයි හිතුවේ. 89 වෙනකොටමට මේ සඳහා අවශ්‍ය කරන සංගීත භාණ්ඩ හා අනෙකුත් උපකරණ මගේ බිරිඳගේ දෙමාපියො තමයි අරගෙන දුන්නෙ.අධ්‍යාපන කටයුතු භාරියාකාරව කරගෙන ගියේ නැහැ.උසස් පෙළත් විෂයන් සියල්ලම අසමත් වුණා. නමුත් අපි සියලු දෙනාම පුදුමාකාර උනන්දුවකින් හා ලොකු කැප කිරීමකින් යුක්තව සංගීත කණ්ඩායමේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන ගියා.

**සන්නස.. ඔබ සංගීතය හදාරලා තියෙනවද?**

නලින් .. මට සංගීතය හදාරන්න නම් අවස්ථාවක් ලැබුණේ නැහැ. නමුත් විශේෂයෙන් මතක් කරන්න ඕන 85 වර්ෂයේ ඉඳලම අපි මේ සංගීත ක්ෂේත්‍රය වෙත යොමු කරන්න බොහොමයක් උදව් කරපු කෙනෙක් හිටිය බෙනට් කන්‍යා සොයුරිය කියල. එතුමිය අද ජීවතුන් අතර නැහැ.අපි ගීතිකා කණ්ඩායමේ මුල් දවස් වල ඉඳලම හිටිය. මෙහිදී බෙනට් කන්‍යා සොයුරිය තමයි අපට නොයෙකුත් ගුරුහරුකම් දීලා අපි ඉදිරියට ගෙනාවේ. එතුමිය නොසිටින්නට අද ඔබ මේ දකින නලින් පෙරේරා බිහි නොවන්නට බොහෝ විට ඉඩකඩ තිබුණා. මම මතක් කරන්න ඕන මම මුලින්ම වේදිකාවට නැග්ගේ එතුමිය නිසා. ඒ 1985 දී. එදා මම ගායනා කළේ සී ටී ප්‍රනාන්දු මහත්මයාගේ ''කිමද සුමිහිරියේ'' ගීතය. ඉතින් සංගීතය හදාරනවා කියලා අපට වෙනමම ඒ සඳහා පාසලෙන් ක්‍රමවේදයක් තිබුණේ නැහැ. අනෙක ශාස්ත්‍රීය සංගීතය තුළින් සංගීත කණ්ඩායමක් කරන්න අමාරුයි. අපේ අරමුණ සංගීත කණ්ඩායමක් බිහි කිරීම නිසා විශේෂයෙන්ම ශාස්ත්‍රීය සංගීතය හැදෑරීමට අප උනන්දු වුණොත් නැහැ,

**සන්නස .. එතකොට මේ සංගීත කණ්ඩායමක් බිහි කළ යුතුයි කියන**